# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2450/57 - 2025 අගෝස්තු මස 22 වැනි සිකුරාදා - 2025.08.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ (1)(අ) වගන්තිය යටතේ නාගොඩ ප්‍රාදේශීය සභාවේ සභික ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොටගෙන නාගොඩ ප්‍රාදේශීය සභාවේ සභික ධූරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ (1)(අ) වගන්තිය යටතේ නාගොඩ ප්‍රාදේශීය සභාවේ අංක 5 - නාගොඩ කොට්ඨාසයට තේරී පත්වූ නාගොඩ ගමගේ දීප්ති කාංචන චතුරංග අයත් වන්නා වූ ජාතික ජන බලවේගය නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම නාගොඩ ප්‍රාදේශීය සභාවේ අංක 5 නාගොඩ කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා කුරගොඩගේ ජයන්ත ප්‍රේමලාල් නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

නාගොඩ ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි, වේවැල්වල හේවගේ රවීන්ද්‍ර විජය කුමාර වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ (1)(අ) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින් නාගොඩ ප්‍රාදේශීය සභාවේ, කුරගොඩගේ ජයන්ත ප්‍රේමලාල් අංක 5 නාගොඩ කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත්බව මෙයින් ප්‍රකාශ කරමි.

**ඩබ්ලිව්. එච්. ආර්. විජය කුමාර,**
තේරීම්භාර නිලධාරි,
නාගොඩ ප්‍රාදේශීය සභාව.

2025 අගෝස්තු මස 22 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
ගාල්ල.

EOG 08 - 0251

1A - G 45215 — 09 (2025/08)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*